©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව
sinhalaebooks.com වෙබ් අඩවිය විසින්
පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

Published with Author Consent.

## 1 කොටස

" තමුසෙ නම් මහ කරුමයක් ඕයී.... චැහ්... ගෙදර ආව ගමන්ම එනවා මෙතන කුඩැල්ලියෙක් වගේ ඇගේ එල්ලෙන්න.... යන දීපන්කරේක යනවකෝ යන්න ඇණයක් නොවී...... ඉඩියට්..... මගුල......

" මන් යනවා යන්න..... "

" ඉතින් යනවා මම අල්ල ගත්තෙ නෑනෙ තමුසෙව.... "

" යනවා තමයි.... තමුසෙගෙ හෙවණැල්ලවත් මට එපා....හ්.... "

"ඉතින් පල#න්.... "

" කොහොමද ඔයා ඔහොම මට යන්න කියන්නෙ.... ආ.... "

" මේ ඕයි යන දිහාවක යනවකො යන්න.... යනවා කිය කිය ඉන්නෙ මෙතන....."

" හරි යනවා... ආය එන්නෙ නැති වෙන්න ම....... "

" ඉතින් යනවා ඕයි....කියව කියව ඉන්නෙ රෙ#ද..... "

( අභිෂේක් එහෙම කියද්දි මන් මගේ රෙදි බෑග් එකත් අරන් කොහෙ හරි දුරකට යනවා කියලා කා එකේ කී එකත් අරන් එළියට ගියා.... )

කිසිම සිහියක් නැතුව හිටිය මම කා එක ඩ්‍රයිව් කරේ කා එකේ වේගෙ ගැන නොහිතා..... හිතුවෙවත් නැති විදියට ඉස්සරහට ආපු ලොරියක හැප්පුනු කා එක විසිවෙලා ගියේ මගෙත් ඇස් පිය වෙලා යද්දි.....

.......................................................................................................................

" දෙවියනේ... මගෙ කෙල්ලව ආරක්ෂා කරලා දෙන්න....."

( ඇස් අරිද්දිත් ඇටන්ඩන්ලා වගයක් ට්‍රොලියක තියලා මාව icu එකට ඇතුළු කරන්න අරන් යද්දි මන් දැක්කෙ කඳුළු පිරුණු ඇස් වලින් ඇටන්ඩන්ලාගෙ වේගයෙන්ම මගෙ අතිනුත් අල්ලන් එන අභිශේක්ව... )

..................................................................................................................

" ඩොක්ට කොහොමද මගෙ වයිෆ්ට දැන්..... "

" හිතුවට වඩා ගොඩක් ඩැමේජ්.... "

" වට්... ඒ කිව්වෙ ඩොක්ට.... "

" ඇත්තටම සොරි මිස්ට අභිශේක් එයා ශොක් වෙලා ඉන්නෙ...අනික එයාගෙ බඩේ තාම සති දෙකක් වත් නොවුච්ච කලලයක් තිබ්ල තියෙනවා.... සොරි ඇත්තටම අපිට බේරගන්න පුලුවන් වුණේ ඔයාගෙ වයිෆ්ව විතරයි....... "

" ඩොක්ට ඒත්..... "

" කාම් ඩවුන් සන්... තව දෙයක් ඔයාගෙ වයිෆ්ගෙ ඔලුවට ටිකක් ඩැමේජ්.... එයාගෙ මතකය ඇත්තටම ආපහු එන්න ටික කාලයක් යාවි... ඒක නිසා එයාට එයාගෙ මතකය ටික ටික ලැබේවි... ඒත් ඔයාලා එයාට එයාගෙ පරණ මතකය බලෙන් මතක් කරන්න ගියොත් මේ ප්‍රශ්නේ තවත් බරපතල වෙන්න තියෙන ඉඩකඩ වැඩී....."

" ඩොක්ට මගෙ වයිෆ්ට සිහිය ඇවිත්ද....... "

" තාම නම් නෑ.... සිහිය ආවාම අපි එයාව වෙනම රූම් එකකට මාරු කරන්නම්..... ඉවසලා ඉන්න ඕකෙ..... "

" ඕකේ ඩොක්ට..... "

.........................................................................................................................

" හෙලෝ උබ කොහොද බන් ඉන්නෙ කෝල් ගත්තට ආන්සර් කරන්නෙත් නෑ....."

"........................................................................."

" අහී....මොකෝ බන් උබ කතා නැත්තේ.... මොකෝ කේස් එක........ "

" මේ මන් උබට කෝල් එකක් ගන්නම්...... "

" මෙහ්... උබ අඩලද ආ..... "

( විශ්වට කිසිම දෙයක් කියන්න ඉඩ නොදී අභිෂේක් කෝල් එක කට් කරේ icu එකේ ඉදන් නස් කෙනෙක් එළියට ආපු නිසා.... )

" න... නස්.... ම.. මගෙ වයිෆ්ට... කොහොමද දැන්.... "

" පේෂන්ට සිහිය නම් ආවා සර්.... ඒත් ඩොක්ටට කියලා ඩොකටර් බලන්න අවසර දුන්නොත් විතරයි සර්ට සර්ගෙ වයිෆ්ව බලන්න පුලුවන්.... සර් ඔතනින් වාඩි වෙල ඉන්න..... "

" ම්.... "

.............................................................................

" ඩොක්ට..... "

" පුතා ඔයා ඇතුලට යන්න.... ගිහින් ඔයාගෙ වයිෆ්ව බලන්න....... "

" ම්.... තැන්කිව් ඩොක්ට.... "

( මන් ඇතුලට යද්දි මන් දැක්කෙ සේලයින් ගහලා ඔක්සිජන් මාස්ක් එකක ආදාරයෙන් හුස්ම ගන්න මගෙ මුරණ්ඩු කෙල්ලව..... )

" මහී..... "

" ක.. කව්ද ඔයා.. "

" මම අභිෂේක්..... "

" ඔ...යා ක...කව්ද මගේ.... "

" මන් තමයි.... ඔයාගෙ හස්බන්...... "

" හ... හස්බන්..... "

" හ්ම්ම්ම්.... "

" ම...මන් බැන්දද.... බදින්න තරන් මට වයසකුත් නෑ.... අනෙව් ඇයි ඔයා මාව බැන්දේ... නපුරෝ කියන්න ඇයි මාව බැන්දේ......"

( කෙල්ල ඒ අහපු ප්‍රශ්නෙට මට හිනා යන්න ආවත් මන් හිනාව පාලනේ කර ගත්තා.... )

" ඔව්.... මන් ඔයාව බැන්දා.... "

" හ්ම්ම්ම්..... මාව දාලා යනවද..... "

( මන් යන්න හදද්දි කෙල්ල මගේ අතින් අල්ලන් එහෙම අහද්දි මන් ඔලුව වැනුවේ නෑ කියන්න....)

"හ්ම්ම්... "

"අනේ.... මෙතනින් වාඩි වෙන්නකො.... "

" හාකො..... "

" අනේ.... ම... මගෙ ඔළුව ඔලුව රිදෙනව.... "

" ගොඩක් රිදෙනවද.... "

" ඔව්... ගොඩක්....ඇයි නපුරෝ මගෙ ඔලුව මෙච්චර රිදෙන්නෙ...අහ්..... "

" ඇයි මැණික........ "

" මට හුස්ම ගන්න බෑ.... "

" කෝ.... ඔය ඔක්සිජන් මාස්ක් එක ඕන්න ඔහොම දාන් හුස්ම ගන්න මී....
හොදට.... හුස්ම ගන්න......... "

" හා...... "

" දැන් රෙස්ට් කරන්න..... "

" මන් ලගින් ඉන්නවනෙ.... "

" ඉන්නවා ඉන්නවා.... බයද.... "

" හ්මම්.... "

( කෙල්ල නිදා ගන්න කන් එතන තිබ්බ පුටුවක වාඩි වෙලා හිටිය මම විශ්වයට කෝල් එකක් අරන් මුල ඉඳලා විස්තරේ කියාගෙන ගියාම ඌත් හොස්පිට්ල් එකට ආවා.... )

..................................................................................................................

" දැන් කොහොමද බන් කෙල්ලට..... "

" සිහිය නම් ආවා.... මහීගෙ බඩේ සති දෙකක් වත් නොවිච්ච කලලයක් තිබිලා...."

( අභීගෙ කට හඬේ තිබුණු ශෝකී භාවය නිසා විශ්වට අභීගෙ හිතේ තියෙන වේදනාව තේරුම් ගන්න එක ඒ තරම් අපහසු කාර්යක් වුණේ නෑ.... )

" වට්..... ඒත් බන් එතකොට දැන් කලලෙ..... "

" කලලෙ නෑ.... මහීව විතරයි බේරන් තියෙන්නෙ.... තව ටිකක් පරක්කු වුණා නම් මහී නැති වෙන්න වුණත් ඉඩ තිබිලා..... "

" අභියා මට ඇත්ත කියපන්..... කොහොමද කෙල්ලට මෙහෙම ඇක්සිඩන්ට් එකක් වුණේ....."

" ඒක වුණේ මගේ වරදින් බන්..... "

" මොකක්ද වුණේ..... "

" අද ඔෆිස් එකට දේශිකා ආවා... "

" ඉතින්.... මොනවද ඒකි කියන්නෙ.... "

" ඒකි කියනවා ඒකිගෙ බඩේ ඉන්නෙ මගේ ළමයෙක් කියලා.... උබ දන්නවනෙ බන් මන් ඔය දේශිකා කියන ගෑනි ඉන්න තැනකවත් ඉන්නෑ කියලා..... "

" හරි හරි ඉතින්...... "

" ඉතින් මුළු ඔෆිස් එකම මන් දිහා අමුතු විදියට බැලුවේ.... හැමෝටමත් බැනලා මන් ගෙදර ආව ම මේකි ඇවිල්ලා මගේ අතේ එල්ලුනා.... මන් බැන්නා ඒකිට යනවා යන්න කියලා.... "

" ඉතින්.... "

" ඒකි මුරණ්ඩුයි.... උබ දන්නවනේ.... යන්න කිව්වොත් නැවති නැවති ඉන්නෑ වෙන කෙල්ලො වගේ...... අහංකාරයි මගෙ කෙල්ල..... ඒකි ඒකිගෙ කා එකේ ගියා.... මාත් හිතේ තිබ්බ කේන්තිය අඩු වුණ ගමන් ඒකි ගැන තිබ්බ බයට ඒකිව ෆලෝ කරා.... ඇත්තටම ඒකි ගියේ යන්න පුළුවන් උපරිම වේගෙන්..... "

" කියපන්...... ඊට පස්සෙ මොකද වුණේ.... "

" ඒ එක්කම ට්‍රැෆික් එකට මන් අහු වුණා... කොහොම හරි ආයම යනකොට වාහන සද්දයක් ඇහුණා.... මාත් ඉතින් බැලුවා මහීගෙ කා එක ට්‍රක් එකක් හැප්පිලා කා එක තිබ්බෙ අනිත් පැත්තට.... මන් ඉතින් කා එකෙන් බැහැලා වග්ගාලා ගිහින් එතන හිටිය මිනිස්සුන්ගෙ උදව්වෙන් කෙල්ලවත් අරන් හොස්පිට්ල් එකට ආවා.... "

" දැන් කෙල්ල.... "

" තාම icu එකේ තව ටිකක් වාට්ටුවට දානවා කිව්වා... කෙල්ලට මොකුත් මතක නෑ බන්.... "

" මොකක්ද..... "

........................................................................................................

**2 කොටස**

" ඔව් බන් අඩුම ඒකිට මතක නෑ මන් ඒකිගෙ හස්බන් කියන එකවත්....... "

" එතකොට...... "

" ඩොක්ට නම් කිව්වෙ බලෙන් මතක් කරන්න එපා කියලා.... කාලයක් යනකොට එයාට මතක් වෙයි කියලා...."

" හ්ම්ම්..... "

" උඹට පුළුවන් නම් ඔෆිස් එකේ වැඩ බලපන්කො.... මට ටික කාලයක් යනකන් ඔෆිස් එකට එන්නෑ.... "

( විශ්ව ගියාට පස්සෙ මන් ගියේ මහී ලගට හොදටම නින්ද ගිහින්..... පව් කියලත් හිතෙන්වා... මේ හැමදේම වුණේ මගේ වරදින් කියලා මතක් වෙන හැම පාරකම මන් මටම ශාප කර ගන්නවා.... )

( සතියකට පස්සෙ ඩොක්ටස්ලට කියලා කියලා කෙල්ලගෙ ටිකට් කප්පවන් ගෙදර එක්ක යන්න මන් ලොකු ට්‍රයි එකක් දුන්නා....කෙල්ලට කිසිම දෙයක් මතක නැති නිසා ඩොක්ටර්ස්ලා දේශනා දීලා දීලා කෙල්ලගෙ ටිකට් කප්පලා දුන්නා..... මන් කෙල්ලවත් අරන් ගෙදර ආවා.... කෙල්ලගෙ රූපෙ වෙනදා වගේ ම තිබුණත් කෙල්ල මනස ඇත්තටම පොඩි එකෙක් වගේ.... )

" අනේ... බෙබි අපි මේ කොයි යන්නේ.... "

" අයියෝ... මහී අපි කොහෙ හරි ගියාම ආය ගෙදර යන්න ඕනි නේද මි... "

" කව්ද අලේ මහී... ඔයාගෙ ඉස්සර ගර්ල්ද.... "

" නෑ.... ඔයාගෙ නම ඒ.... "

" මගේ නම මහී... හී... එහෙම වෙන්නෙ කෝමද මගෙ නම බබී..... "

"නෑ....ඒක නෙමෙයි... ඔයාගෙ අම්මයි තාත්තයි ඔයාට දාලා තියෙනවා ලස්සන නමක් ඒ මහීමා නෙත්මි.... "

" බා....ඔයා මට කතා කලන්න ඕනේ බබී කියලා විතරයි.... විතරයි... විතරමයි..... "

" ඔහ් මයි ගෝඩ්.... ඕකේ ඕකේ හරි බබී.... දැන් හරිනේ.... "

" හලී.......... "

කෙල්ල කිසි කතාවක් නැතුව කා එකේ ග්ලාස් එකට මූණ තියන් ඔහේ පාර බල බල යන නිසා මාත් කිසි කතාවක් නැතුව කා එක ඩ්‍රයිව් කරා.....

" ඈ.... නවත්තන්න නවත්තන්න..... "

...............................................................................................................

## 3 කොටස

" ඇයි මහී........ "

" මහී නෙමේ නපුරෝ බබී.... "

" හරි හරි... ඇයි කියන්නකො.... "

" අර.... ටෙඩියෝ... අනේ... හොඳ මෙයා වගේ අලන් දෙන්නකෝ.... "

" දැන් බෑ මැණික.... "

" බා.. බා... දැන් ම අලන් ඕනේ.... නැත්තන් මන් අඬනෝ..."

" හරි හරි පොඩ්ඩක් ඉන්න අපි කා එක නවත්තලා ඉමු මුලින්ම... "

" හා... "

කෙල්ලවත් එක්කන් ශොප් එක ඇතුළට ගියාම කෙල්ල දුවගෙන ගිහිල්ලා ලොකු ලොකු ටෙඩියෝ අදින්න ගත්තා.... ශොප් එකේ හිටිය ගර්ල් කෙනෙක්ට මන් කිව්වෙ එයාට ඕන දෙයක් කරන්න දෙන්න කියලා....මාත් ඉතින් බලන් කෙල්ල කරන විකාර වැඩ දිහා බලන් හිටියා.... ඒත් කෙල්ල වෙනදට වඩා දැන් ඉන්න විදිය හොඳයි කියලා එක වෙලාවකට හිතුණත් සමහර වෙලාවට කෙල්ල ඉන්න විදිය දැක්කම කෙල්ල ගැන දුක හිතෙන වාරත් අනන්තයි....

ටික වෙලාවකින් කෙල්ල කහ පාට තඩි ටෙඩියෙකුයි තව පුංචි ටෙඩියො දෙන්නකුයි උස්සන් මගේ ලගට ආව නිසා මාත් කෙල්ල දිහා ඇස් පිල්ලන් නොගහා බලන් හිටියා....

" නපුරෝ මේ.... මන් මේ දෙක ගන්නෝ... "

" දෙක ඕතන දෙකක් නෙමෙයි ඕතන ටෙඩියො තුන්දෙනෙක් ඉන්නවා පිස්සි...."

මන් එහෙම කිව්ව ම මේකි ඉන්න හරියට යකෙක් දැකලා වගේ මන් දිහා බලන්....

" කෝ දෙනවා.... "

( මම කෙල්ලගෙ අතේ තිබ්බ ටෙඩියෝ ටිකටත් පේ කරලා එක අතකින් කෙල්ලගෙ අතින් අල්ලගෙන එක ටෙඩියෙක් කෙල්ලට දීලා අනිත් ටෙඩියෝ දෙන්න මගේ අතට ගත්තා... )

කා එක ඩ්‍රයිව් කරන ගමනුත් මන් කෙල්ල දිහා නොබලා ඉන්න අමතක කරේ නෑ.... කෙල්ල ටෙෆියෝ තුන් දෙනාම බදාගෙන හොදට නිදි...

( ගේ ලගට ඇවිල්ලත් කෙල්ල නිදි නිසා කෙල්ලගෙ ලගට කිට්ටු වෙලා කෙල්ලට කිස් එක්ක දුන්නා... )

" මහී... මහී.... නැගිටින්න අපි ගෙදර ආවා... "

" ආ... ගෙ.. ගෙදර... කෝ... ගෙදර... "

" අර තියෙන්නෙ... "

( කෙල්ල ගෙදර දැක්කා විතරයි මන් දැක්කා කෙල්ල බය වෙනවා... )

" ඇයි මහී.... "

" අනේ... බා මට මේ ගෙදර ඉන්න... ම..මට මේ ගේ ඉන්න බා... අනේ.. අපි වෙන කොහෙ හරි යන්.... "

( කෙල්ල මහ හයියෙන් එහෙම කියලා ටෙඩියෝ තුන් දෙන බදාගෙන ටෙඩියෝ අස්සට මූණ ඔබා ගත්තා... )

" ආහා... කෝ ඔහොම ඉන්නකො අඩන්නැතුව පොඩ්ඩක්.... ඔයාගෙයි මගෙයි රෙදි තියෙන්නෙ මෙහෙ... විනාඩියක් ඉන්න ටග්ගාලා එන්නම්... "

මහීගෙයි මගෙයි රෙදි බෑග් දෙක වාහෙනේට අරන් ඇවිත් වාහනේ ස්ටාට් කරේ කෙල්ලට බලෙන් මේ දේවල් මතක් කරන්න යන්න එපා කියලා ඩොක්ට කියපු නිසා...

..............................................................................................................

## 4 කොටස

මන් පොඩි කාලෙදි මගෙ අම්මයි තාත්තයි ජීවත් වුණේ වෙනම... ඇත්තටම ඒ දෙන්න වෙනම ජීවත් වුණත් දෙන්නම මට පණ වගේ ආදරෙයි... අම්මා ලග ඉන්නෙ දවස් තුනයි නම් තාත්තා ලග ඉන්නවා දවස් හතරක්.... ඉතින් පොඩි කාලේ ඉදන් මගේ ජීවිතේ ගෙවුනෙ ඔහොම...

මගෙ අම්මා මට මැරි කරාම ඉන්න වෙනම ගෙයක් හදලා තියෙන්නේ.... තාත්තත් එහෙමයි... ඉතින් ගෙවල් දෙකම මට... මගේ නමට....

මහීව මැරි කරාට පස්සෙ මහී අම්මටයි තාත්තටයි කියලා කියලා මගෙ අම්මවයි තාත්තවයි එකතු කරා... මහීයි මායි මැරි කරපු දවසෙ ඉදන් ජීවත් වුණේ මට තාත්තා හදපු ගෙදර..

ඒත් දැන් කෙල්ල ඒ ගෙදර ඉන්න බෑ කියන නිසා මන් කෙල්ලවත් එක්කන් ආවේ අම්මා මට ඉන්න හදපු ගෙදරට.....

කොච්චර සල්ලි තිබ්බත් එතන කිසි සතුටක් නැත්තන් ජීවිතේ වැඩක් නෑ.... පොඩි කාලෙදි මටයි මගෙ අම්මටයි තාත්තටයි කොච්චර උතුරන්න සල්ලි තිබ්බත් වැඩක් නෑ මොකද මන් පොඩි කාලෙ සතුට කියන්නෙ මොකක්ද කියාවත් දන්නෑ...

ඒත් මහී මගේ ජීවිතේට ආපු දවසෙ ඉඳන් ජීවිතේ කියන්නෙ මොකක්ද කොච්චර කොහොම දුප්පත් වුණත් එතන සතුට තියෙනව නම් ඒක තමයි ජීවිතේ කියලා මහී මට කියන වාර අනන්ත අප්‍රමානයි.....

( කා එක ගෙදරට දාලා කෙල්ලගෙ අතිනුත් අල්ලන් ගෙදර දොර ඇරලා කෙල්ලව එක්කන් රූම් එකට ආවා.... )

" ෂා... මේ ගේ නම් මලූ හලෝ....

" හ්ම්ම්.... "

" අනේ අපි මෙහෙ ඉමුකො නපුරො.... "

" කැමතිද මෙහෙට.... "

" ඔව් ගොඩාරියක්.... "

" හ්ම්ම්... එහෙනම් ඔයා ඔහොම ඉන්න... "

" කොහෙද යන්නෙ ඔයා.... "

" අයියෝ අපි දෙන්නගෙ ඇඳුම් බෑග් දෙක ගේන්න... "

" හා... හා... යන්න ඔයා... "

" හ්ම්ම්.... "

( කෙල්ලගෙයි මගෙයි රෙදි බෑග් දෙකත් ගේ ඇතුළට අරන් ඇවිල්ලා... ගෙදර ගේට් එකත් ලොක් කරලා... දොරත් වහන් ගේ ඇතුළට ආවා.... )

( කෙල්ලගෙ රෙදි බෑග් එක කෙල්ල හිටිය රූම් එකෙන් තියලා මන් මගේ බෑග් එකත් අරන් කෙල්ලගේ රූම් එකෙන් යන්න හදද්දි ම කෙල්ල මගෙ අතින් අල්ල ගත්තා.... ටික වෙලාවක් මගෙ දිහා බල්න් ඉදලා මගෙ අත අත ඇරලා මන් දිහා බලන් හිටියෙ හරියට පොඩි එකෙක් වගේ...

" ඇයි.... "

" නපුරා... කොහොද යන්නෙ.... "

" මගේ රූම් එකට..... "

" අනේ බා අපි එකට දොයිය ගමු.... "

" බෑ බෑ මහී.... "

" අලෙ ඇයි....... "

" මට හෙම්බිරිස්සාව... ඔයා එක්ක මන් එකට නිදාගත්තොත් ඔයාටත් හෙම්බිරිස්සාව හැදෙයි ඒක නිසා හොද ළමයා වගේ මේ දවස් ටිකට විතරක් ඕකෙ නිදාගන්න...අනික බබීට ඉන්නවනේ බබීගෙ ටෙඩියෝ බබීට බය වෙන්න දෙයක් නෑ ඒ නිසා.. "

( කෙල්ලගෙ මූණට ලං වෙලා එහෙම කියලා.... මන් මගේ රූම් එකට ආවේ මට කෙල්ලගෙ මතකය අමතක කාලෙදි කෙල්ලගෙ ලෙඩෙන් අයුතු ප්‍රයෝජන ගන්න මන් අකමැති නිසා.... )

( රෑ වෙච්ච නිසා මන් කෙල්ල වොෂ් එකක් දාගෙම එනකන් කෙල්ලගෙ රූම් එකට වෙලා හිටියා... කෙල්ල ආය ආවම කෙල්ලත් එක්ක මගේ රූම් එකට ගියා.... මාත් වොෂ් එකක් දාන් ඇවිල්ලා කෙල්ලවත් උස්සන් කිචන් එකට ගිහින් මන් රෑ කෑම ලෑස්ති කරන කන් කෙල්ලව ටයිල් බැම්ම උඩින් වාඩි කරවලා කෙල්ල ලගට ගිහින් එළවලු කැපුවා.... )

( එළවලු ටික කප කප ඉන්න අතරෙදි කෙල්ල මගෙ කොණ්ඩෙන් අදිනවා.... )

" මොනවද මහී කරන්නෙ... "

" ආ... මන් මහී නෙමේ අලෙ බබී... "

"අයියෝ හරි හරි මන් කෑම හදනකන් ඔන්න ඔතනට වෙලා බලන් ඉන්න ඕනෙ තෙරුණාද මගෙ ගොන් වැස්සිට..... "

" ගොන් වැස්සි.... "

" ඔව්... "

( මන් ඉතින් කෙල්ලට එහෙම කියලා රයිස්කුකර් එකේ බත් එක ගැහුවා....
පරිප්පුවක් හදලා සෝයාමීට් එකත් ඩෙවල් එකක් දාන්න පටන් ගත්තා... )

" ආව්.... අහ්.... නපුරෝ... "

.................................................................................................................

**5 කොටස**

( කෙල්ලගෙ කෑ ගැහිල්ලට පිටි පස්ස හැරිල බලද්දි කෙල්ලගෙ අත කැපිලා
හොඳටම ලේ ගලනවා..... ගෑස් එකත් එහෙම්ම වහලා දාලා කෙල්ලවත් අරන්
කාමරේට ගිහිල්ලා කෙල්ලගෙ අත පුළුන් කෑල්ලකින් පිහිදලා කෙල්ලගෙ අතටත්
බෙහෙත් දාලා කෙල්ලට ඇදට වෙලා නිදගන්න කියලා සැර කරලා මන් ආයම
කිචන් එකට ආවා...)

( රෑට කෑම උයලා මේසෙටත් තියලා කෙල්ලත් එක්ක රෑට කෑම කාලා මන්
කෙල්ලවත් එක්කන් කෙල්ලගෙ කාමරේට ගියා.... )

" මේ නපුරො... ඔයාගෙ කෑම හරී රසයි.... "

" හ්ම්ම්.... "

( කෙල්ලට බෙහෙත් තෝර තෝර ඉන්න ගමන් ම කෙල්ල අහන ප්‍රශ්න වලට
උත්තර දුන්නා... )

" නපුරෝ මේ... "

" නපුරා කව්ද.... "

" ඔයානෙ අලේ... "

" මම... මම නපුරු නෑ.... "

" ඒ වුණාට ඒ නම ලස්සනයි ඔයාට... "

"...................................................................... "

" ඇයි අලේ ඔයා කතා නැත්තේ.... මේ කොණ්ඩේ සෝයි... මන් ආසයි... "

" බහප්... අල්ලන්නෑ මගේ කොණ්ඩෙ... "

( කෙල්ල මගේ කොණ්ඩේ අල්ලන්න යද්දි කෙල්ලට ඔරවලා සැර කරා... පව් ඒ පාර නම් ඒ වුණාට කෙල්ල බය වුණා... )

" ආ... මේ බෙහෙත් ටික බොන්න..... "

" මට බා... "

" මහී... මන් ගැන හිතලවත් බොන්න.... "

" බා... ඔයා හරි නරකයි මන් හිතන්නෑ ඔයා ගැන... එපා... ඔයාම බොන්න... "

( කෙල්ල එහෙම කියලා කොට්ටෙට ඔළුව ඔබා ගත්තා... )

" මහී... ආ කෝ... නැගිටින්න මගේ කොණ්ඩෙ අතගාන්න කැමති නම් නැගිටින්න... "

" ආ... කොණ්ඩෙ අතගාන්න දෙනව නම් හා... "

" ආ මෙන්න බොන්න... "

( කෙල්ල ටග්ගාලා බෙහෙත් ටික බීලා මගෙ කොණ්ඩෙ අත ගාන්න ගත්තා පොඩි එකෙක් වගේ කොණ්ඩෙ ඉබ ඉබ මගෙ ඔළුවට උම්මා දෙනවා.... )

( මගෙ අම්මගෙන් ලැබුණ සෙනෙහසට වඩා සෙනෙහසක් ඇත්තටම මට මහී ලගින් ලැබුණා... )

" කෝ කෝ දැන් ඇති ඔයා නිදා ගන්න මොනා හරි ඕන වුණොත් මගේ කාමරේ දොරට තට්ටු කරන්න..... "

" මට බා.... මන් කළුවරට බයයි.... "

" හ්ම්ම් ඒකත් එහෙමද හරි එහෙනම් මට ටිකක් හයියෙන් කතා කරන්න.... "

"හා.... "

( මන් ඉතින් කෙල්ලට එහෙම කිව්වට මන් දන්නවනෙ මගෙ හැටි... මට නින්ද ගියාම සුනාමියක් ආවත් මන් දන්නෑ ඉතින්.... )

( කෙල්ල නිදා ගන්නකන් කෙල්ල ලගට වෙලා ඉදලා කිවන් එකට ගිහින් කෑම ෆ්‍රිජ් එකට දාලා කාපු බීපු පිගන් ටිකත් හේදුවා.... වෙනදා මහී කරන වැඩ අද මට කරන්න වෙලා.... )

( මාත් ඉතින් ගෙදර දොර ජනෙල් ආයෙමත් වහලද බලලා කෙල්ලගෙ රූම් එකට ගිහින් රූම් එකෙ ලයිටුත් ඕෆ් කරාලා මත් ආවා මගේ රූම් එකට නිදා ගන්න.... )

ඔබ මාගේ හැම හීනේම ඇ වෙන්න....

ඔබ මා ගයන ගීතයක රෑ වෙන්න....

( පෝන් එකේ එලාම් එකත් ඕෆ් කරලා නැගිටලා එහෙම්ම ගියේ කෙල්ලගෙ රූම් එකට කෙල්ල ඇදේ එහෙට මෙහෙට පෙරලෙනවා....)

( මාත් ඉතින් කෙල්ල ලගට ගිහින් කෙල්ලට කිස් එකක් දුන්නා.... )

" බේබී..."

" කියන්න මැණික.... "

" බඩගිනි මට.... "

" හ්ම්ම්... මූණ එහෙම හෝදන් එන්න.. මන් පිටි එකක් හදන්නම්.... "

sinhalaebooks.com

" හා.... මේ අත.... "

" රිදෙනව ද මැණික.... "

" හ්මම්ම්..... "

" හරි හරි ඔයා මූණ හෝදගෙන පල්ලෙහට එන්න.... මී... මන් යනවා... "

( කෙල්ල මට හිනා වෙලා වොෂ් රූම් එකට ගියා.... )

`` එක අතකට මේකි මෙහෙම ඉන්න එකත් හොඳයි.... වෙනදා වගේ මගෙ කීම අහක දාන්නෙත් නෑ... කිව්ව ගමන් හැම දේම කරනවා... අනේ පිස්සු කෙල්ල... ´´

( මම කිවන් එකට ගිහින් මටයි කෙල්ලටයි පිටි එකක් හද හද ඉද්දි කෙල්ල රෝස පාට කොට ගවුමක් ඇදන් මගේ ඉස්සරහ ඉන්නවා.... )

" බේබී... යන්කෝ පොටෝ ගහන්න...

" කොහේද.... "

" එළියෙ අනේ.... අර පින්තූරයක් ගහලා තියෙන්නෙ ඔයාගේ ඒ වගේ මගේ පොටෝත් ගහලා මගෙ කාමරේ එල්ලන්න.... "

" එහෙමද ආස.... "

" හ්ම්ම් ඔව්... එහෙම මන් ආසයි... "

" හරි හරි ආ මේක බොන්න... මන් ඇදුමක් දාන් එන්නම්... "

( මාත් ටීෂට් එකක් දාගෙන ගියා කෙල්ල එක්ක පොටො ගහන්න.... කෙල්ල කෙල්ලගෙ රෝස පාට ටෙඩියත් අතේ තියන් එහෙට මෙහෙට ඇඹරි ඇඹරි පොටො ඇක්ෂන් ගන්න කියනවා... මාත් ඉතින් කෙල්ලගෙ පොටෝ ගැහුවා... )

" බේබී... බේබි තව ගන්නකො.... "

" දැන් ඇති එනවා යන්න ගෙට.... "

( බොහොම අමාරුවෙන් කෙල්ලවත් උස්සන් ගෙට ආවා.... )

........................................................................................................................

" බේබි....බේබි... අනේ නපුලො.. ඔයා කොහෙද ඉන්නෙ.... "

( කෙල්ලගෙ කෑ ගැහිල්ලට කෙල්ලගෙ රූම් එකට ගිහින් බලනකොට මේකි ඉන්නවා ඇද උඩට වෙලා.. )

" ඇයි.... "

..................................................................................................................

## 6 කොටස

" මන් දින්නා මේ.... "

" මහී.."

" නෑ බබී...."

" හරි බබී ගේම් ගහන්න එපා ඔයා...."

" මිහ් ඇයි ඒ.... "

" හොද නෑ... කෝ ඇදුමක් දාන් ලෑස්ති වෙන්න අපි ගමනක් යන්.... "

" ගමනක්.... "

" හ්මම්...."

" ඒ කොහෙද... "

" ලැස්ති වෙන්නකො... "

" හලී... "

( මන් කෙල්ලව එක්කන් ගියෙ පාක් එකට මොකද ඩොක්ටර් කිව්වා කෙල්ලට නිස්කලංක පරිසරයක ඉන්න දෙන්න කියලා.... )

" හරිම ලස්සනයි.... මේ නපුරෝ මොනවද අනේ ඔයා කල්පනා කාන්නෙ.... "

" ම... මො..මොකුත් නෑ මහී.... "

" නෑ වෙන්න බෑ... "

" මේ මන් ඔයාට පොරි අරන් එන්නම්... මී... ඕතනම ඉන්න.."

" හා.... "

( ඇත්තටම මන් කල්පනා කර කර හිටියෙ ඉස්සර මායි මහියි මෙතනට එන හැටි අපි දෙන්න මෙතනට වෙලා ඉන්නකොට මහී කරන විකාර වැඩ.... )

( කෙල්ලට පොරි මල්ලක් අරන් යනකොට කෙල්ලගෙ ලගින් කොල්ලෙක් වාඩි වෙලා කෙල්ලගෙ මූණ දිහා බලන් හිනා වෙනවා... )

" මහී..... මෙහෙ එනවා.... "

" මහී නෙමෙයි නපුරෝ බබී.... "

" හරි හරි බබී... අපි යන් දැන්.... පරක්කු වෙනවනේ.... "

" හලෝ... අපි යනවා හොදේ බායි... "

( කෙල්ල එහෙම කියලා කා එකට දුවලා ගියා... ටිකකින් අර පිරිමි ළමයා මන් ඉන්න තැනට ආවා... )

" ඒ ඔයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ් ද.... "

" නෑ... ඒ මගෙ වයිෆ්.... "

" එහෙමද... "

" ඔව් ඇයි.... "

.................................................................................................................

## 7 කොටස

" ඒ ඔයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ් ද.... "

" නෑ... ඒ මගෙ වයිෆ්.... "

" එහෙමද... "

" ඔව් ඇයි.... "

..........................................................................................................................

" නෑ නිකන්.... මේ තියෙන්නෙ මගෙ නම්බර් එක.... කැමති වෙලාවක මට කෝල් කරන්න.... "

" හඃ... ඒ මොකටද........ "

" ඇත්තටම ඔයා මට ඔහොම කතා කරන එක සාධාරණයි මොකද ඔයා දන්නෙ නෑ මන් කව්ද කියල...... "

" මට දැන ගන්න උවමනාවක් නෑ.... "

" මන් දන්නවා..... ඔයාගෙ වයිෆ් හරියට මගේ නන්ගි වගේ.... එයා දැන් නෑ.... ඇත්තටම මන් අවාසනාවන්තයි.... "

" හඃ.... ඉතින් ඇයි දැන් තමුන් මට ඕවා කියන්නෙ ආ.... "

" මට ඔයාගෙ වයිෆ්ව...... "

" වයිෆ්ව... මොනවද අයිසෙ තමුසෙ කියවන්නෙ ආ...."

" මේකයි මට.... "

" මොකක්ද ආ... තමුසෙ කියන්නෙ මගේ වයිෆ්ව තමුසෙට දෙන්න කියලද.... "

" මන් එහෙම කියන්නෑ.... මන් දහම්..... මන් යන්නම්.... "

" යනවා ඉතින්.... "

( ඒ කොල්ලටත් බැනලා මන් කා එකට එනකොට කෙල්ල මූණ බෙරි කරන් බලන් ඉන්නව.... )

" ඇයි මැණික...... "

" එපා කතා කරන්න.... නපුරා... ඔයා නපුරුම නපුරුයි...එපා මාත් එක්ක කතා කරන්න.... "

" මහී ඇයි මේ ආ..... "

" ඔයා මගෙ අයියට බැන්නා..... "

( කෙල්ල බුම්මන් එහෙම කිව්වම මන් ආපහු අර බෝයි ලගට ගිහින් එයාගෙ නම්බර් එක ඉල්ල ගත්තා.... ඊට පස්සෙ ඉතින් කෙල්ල එක්ක ගෙදර ගියා.... )

( දවස් දෙක තුනක් ම ඔය විදියට ගෙවෙද්දි කෙල්ල කෙල්ලට බබී කියන නමින් කතා කරන්න කියලා බල කරන එක නතර කරා.... )

" නපුරා..... මේන් ඔයාට කෝල් එකක්....... "

" කව්ද බලන්න....... "

" හෙලෝ..... "

" ආ මගෙ නංගිනෙ මේ.... කොහොමද ඉතින් ම්.... "

" ආ... කව්ද මේ.... "

" මන් දේශාන් නංගි... මොකද කරන්නෙ.... කාලද ඉන්නෙ ම්..... "

" අනේ මෙ දේශාන් අයියනේ... ඔව් මන් කෑවා... අනේ මාව බලන්න එන්නකෝ...."

" හරි හරි මැණික මන් එන්නම් ඔයාව බලලා යන්න..... "

" අද එන්නකො..... "

" හ්ම්ම්... මේ ඔයාගෙ පොන් එකද..... "

" නෑ... නපුරගෙ.... "

" ඔයාගෙ නම්බර් එක දෙන්න නැත්තන් ඔයාට බැනුම් අහන්න වෙයි.... "

" මම නම්බරේ ගන්න දන්නෑ.... මට ගන්න හැටි මතක නෑ.... "

"හ්ම්ම්.... හරි මැණික මන් වැඩ කරන ගමන් ඉන්නෙ තියන්නම් හොදද....... "

" හරී......... "

මන් කතාව මෙතන ඉදන් පොඩ්ඩක් කියන් යන්නම්..... ( මහී )

අයියා එක්ක කතා කර කර ඉද්දි නපුරා ටවල් එක පිටින් ආවා එළියට.... මම නපුරගෙ කාමරේට ආවේ නපුරා මාවත් එයාගෙ කාමරේට එක්කන් ආව නිසා....

" කව්ද....... "

" මගේ අයියා... "

" මගේ අයියා.... හ්.. කව්ද අර දේශාන් ද මොකාද එකා නේ.... "

" එපා එයාට මොකාද එකා කියන්න.... මන් තරහයි.... "

" තමුසෙ ආය ඒ මිනිහා එක්ක කතා කරලා අහු වුනොත් බලා ගමු.... "

" බා... එයා මගේ... "

" මොකක්ද කියන්නෙ ආ.... "

" අහ්... "

( කෙල්ලගෙ කම්මුල හරහා මගේ අත ගියා... කෙල්ල ඇස් වල කඳුළු පුරවන් දුවගෙන ගියා... )

( මාත් ඉතින් රූම් එකේ ඉදන් දේශාන්ගෙ නම්බර් එක බ්ලොක් කරලා කිවන් එකට ගියේ කෑම හදන්න..... )

( හවස් වෙනකනුත් කෙල්ල රූම් එකෙන් ආවෙ නැති නිසා මාත් ඉතින් කෙල්ල කෙල්ලට ඕන වෙලාවක එලියට එයිනෙ කියලා හිතලා පෝන් එක ඔබ ඔබ ඉදිද්දි ආවේ දේශාන්...... )

" මල්ලි... "

" තමුන්.... ඇයි මෙහෙ..... "

" මන් ආවෙ මහීව බලන්න..... "

" නෑ... මහී නෑ.... ඒක නිසා යන්න ඔයා.... "

" එහෙමද එයා කොහෙ ගිහින්ද.... "

" ඒක තමුන්ට වැඩක් නෑනේ..."

" හරි මන් යන්නම්..... "

( දේශාන් එහෙම කියලා ගියාම මම ගෙදර දොරත් වහලා කෙල්ලගෙ කාමරේට ගියා.... )

" මහී.... "

( කෙල්ල හොඳටම නිදි.... කෙල්ලගෙ කොට්ටෙ කඳුළු වලින් ම තෙත් වෙලා... )

( කෙල්ලට ඕහේ නිදා ගන්න දීලා මාත් මගේ රූම් එකට ඇවිල්ලා නිදා ගත්තා.... )

( රෑ 8 වගේ වෙනකොට මාත් නැගිටලා කෙල්ල ඉන්න රූම් එකට ගියා.... කෙල්ල ගිනි කබල වගේ රත් වෙලා.... )

" මහී.... "

" මට සීතලයි.... "

" ඔහොම ඉන්න මහී.... අපි යන් බෙහෙත් ගන්න..... "

( කෙල්ලවත් එක්කන් ගියා බෙහෙත් ගන්න කෙල්ලටත් බෙහෙත් අරන් අපි දෙන්න ආපහු ගෙදර ආවා... )

( බලෙන් ම කෙල්ලට බත් කටාල් හතරක් පහක් විතර කවාගෙන බෙහෙත් ටිකත් පෙව්වා.... රෑ කෙල්ල ලගටම වෙලා මාත් හිටියා... උදේ නැගිටිද්දි මාත් කෙල්ලගෙ ඇඳේ කොනකට ඔළුව තියන් නිදාගෙන හිටියෙ.... කෙල්ලගෙ උණ බැහැලා තිබ්බ නිසා මාත් ගිහින් උදේම නා ගත්තා....)

" නපුරෝ... "

" ඇයි.... "

" බඩගිනී.... "

" හ්ම්ම්.... "

( සතියක්ම ගෙවිලා ගියා... ඒත් මහීට මතකය නෑ.... )

( කෙල්ලගෙ වැඩ කර කර ඉදලා පල්ලෙහාට ආවේ කව්දෝ ගෙදර දොරට ගහන සද්දෙ ඇහිච්ච නිසා )

" අඩෙහ්.... විශ්වයා... උබලට අපිව මතක් වෙන්නෙවත් නෑ නේ බන්... "

" අනේ නිකන් හිටු... කෝ කෙල්ල... "

" නිදි බන්.. "

" තාම කෙල්ලට මුකුත් මතක නැද්ද අභියා.... "

" නෑ බන්.... "

" මේ ඒක නෙමෙයි මොකක්ද බන් අර සීන් එක... "

" මොන.... "

" අර මේ පැත්තෙ කොල්ලෙක් කැරකෙනවා කියලා නිර්මිත කිව්වා.... "

" ආ වෙන්න ඇති බන් ඔල්මාද කාරයෙක් කැරකෙනවා තාමා.... මහීට නංගි ගුන්ගි ගාගෙන... "

" මේ කෙල්ලව පරිස්සන් කර ගනින්.... "

" ඔව් ඔව් බන් මන් පුලුවන් උපරිමෙන් ආරක්ෂා කරනවා... "

" නපුරෝ.... කෝ ඔයාගෙ පෝන් එක..."

( කෙල්ල එහෙම කියගෙන පඩිපෙල බහිද්දි ම ආය කෙල්ල දුවගෙන ගියා.... )

" ඒ මොකද බන් ඒ වුණේ... මට කියහන් ඇයි උබට කෙල්ල නපුරා කියන්නෙ කියලා... උබ ඒකිට සැර කරාද...... "

..........................................................................................................................

**8 කොටස**

" නෑ බන් මේකිට පිස්සු..... දැන් කාමරේට ගිහිල්ලා විකාර කර කර ඇති.... "

"හ්ම්ම්... මේ නංගිගෙ බර්දේ එක හෙට නේද.... "

" අම්මට හුඩු... ඔව්නෙ අමතක වුණා බන්.... "

" ඔව් ඉතින් උබට මේ තියෙන ප්‍රශ්නත් එක්ක කොහෙ මතක් වෙන්නද බන්.... හරි හරි දැන් උබ මොකද කරන්න හිතන් ඉන්නේ.... "

" මොනා කරන්නද බන්.... "

" හැබැයි මචෝ අපි බර්දේ පාර්ටි එකක් ගත්තොත් කෙල්ලට සතුටට ම මේ දේවල් මතක් වෙන්නත් ඉඩ තියෙනවා.... "

" හ්ම්ම්... ඒකත් ඇත්ත තමයි...."

" උබ කැමතිද බර්දේ පාර්ටි එකක් ගන්න.... "

" ගමු බන්.... "

" එහෙනම් ඉතින් එච්චරයිනේ... මන් අපේ කොල්ලො සෙට් එකට කියන්නම්... "

" අපේ සෙට් එකට කියන එක හොදයි බන්... දන්නැති උන් ආවොතින් කෙල්ලගෙ ආරක්ෂාව ගැන පොඩි ප්‍රශ්නයක් ඇති වේවි... අපේ සෙට් එක කොහොමත් හොදයි..."

" හ්ම්ම්..... එහ්විනම් මචන් මා යන්නම්....ආ මේක නංගිට දීපන්.... "

" හරි බන් පරිස්සමෙන් යන්න.... "

( විශ්ව ගියාට පස්සෙ මන් දොරත් වහලා ගියේ කෙල්ලගෙ කාමරේට.... කෙල්ල කාමරේ නැති නිසා මන් වටේම බැලුවා... )

" මහී... කෝ ඔයා..... "

"මේ නපුරෝ ඒ ආපු එක්කෙනා ගියාද... "

" කොහෙද ඉන්නෙ ඔයා...එළියට එන්න... මෙන්න එයා ඔයාට චොකලට් එකකුත් අරන් ඇවිල්ල.... "

" අනේ... හරි සෝක්... "

( කෙල්ල ඇද යට ඉඳන් එළියට ආවා... ඊට පස්සෙ චොක්ලට් එකත් අරන් ඇද උඩින් වාඩි වුණා... )

" බබී... "

"ඇයි... "

" ඔයා අර අයියට බයද... ඇයි කියන්නකො දිව්වෙ එයාව දැකලා... "

" එයාගෙ රැව්ල...වැඩී කොණ්ඩෙත් වවලා.... ඉතින් සුදු වුණත් එයා යකෙක් වගේ..."

" හරි හරි ඕක කන්නකො එහෙනම් හොඳද... මේ මන් එළියට යනවා.... මන් ගෙදර දොරේ යතුරත් අරන් යන්නෙ කවෘ ආවත් සද්ද කරන්න එපා.... කාමරේ දොර වහගෙන ඕක කාලා නිදා ගන්න... එහෙම බෑ නම් ටීවි බලන්න ඔන්න රිමෝඩ් එක.... "

" හරී... "

( මන් කෙල්ලගෙ දොර ලොක් කරේ නෑ... ගෙදර දොරත් ලොක් කරලා මන් කා එක ගේට් එකෙන් එළියට දාලා ගේට් එකෙත් ඉබ්බා දාලා ගියේ කෙල්ලගෙ ආරක්ෂාව ගැන හිතලමයි... )

..........................................................................................................

" හෙලෝ බන් විශ්ව....."

" අහ්... කියපන්... "

" මේ උඹ අද මෙහෙ එනවනෙ.... "

" ඔව්... "

" මේ එනකොට කොන්ඩෙ කපාලා... රැවුල කපලා වරෙන්.... "

" ඒ මොකෝ ඒ... මේ වැඩත් එක්ක කපන්න වෙලාවක් තිබ්බෙ බෑ බන්... "

" කපාගෙන වරෙන්.... එදා කෙල්ල උඹට බයට දුවලා තියෙන්න... යකෙක් වගේ කියලා... "

" එහෙමද හරි හරි බන්... මන් කපන් එන්නම්... "

" හ්ම්ම්... හරි මචං මන් තියනවා.. "

( ඊයෙ කඩේ ගිහිල්ලා ගෙනාපු බැලූන් බෝල ටික ටේබල් එක උඩින් තියලා ගෙදර ඩෙකරේෂන් වැඩ ටික කර කර විශ්වට කෝල් එකක් ගත්තෙ අදත් කෙල්ලව බය කරන්න බැරි නිසා... )

" බබී... "

" ඇයි... "

" මොකද කරන්නෙ මැණික... වැඩක්ද ඔයා.... "

" නෑ... මන් චිත්‍ර අදිනවා... "

" බබී කැමති කාටද... "

" මොනවගෙන්ද... "

" ඔය කාටුන් කැරැක්ටර්ස් වල ඉන්න ප්‍රින්සස්ලගෙන්.... "

" මන් ප්‍රින්සස්ලගෙන් කැමති ස්ටෝබෙරි ෂෝට් කෙක්ට... "

" හ්ම්ම්... මෙ එලියට එන්න එපා අද... "

" ඇයි ඒ... "

" ඔයා නිදාගන්න එහෙමත් නැත්තම් කාමරේට වෙලා ඔයා කැමති දෙයක් කර ගන්න.... "

" හරි... එතකොට මට බඩගිනි වුණාම.... "

" මන් කෑම ටික අරන් එන්නම්... "

" හ්ම්ම්.... "

( කෙල්ලගෙ කාමරේ දොරත් වහගෙන මන් සාලෙට එද්දි විශ්වයා ඇවිල්ලා හිටියා.... )

" උඹ මෙච්චර ඉක්මනට ආවද.... "

" එහෙම තමයි මේ කොල්ලගෙ වැඩ..... "

## 9 කොටස (අවසානයට පෙර)

" මේ උඹ අපේ කොල්ලො සෙට් එකට කිව්වද... "

" ඔව් බන් උන් එනවා කිව්වා.... "

" මේ බන් මට පොඩි උදව්වක් කරහන්..... "

" මොකක්ද..... "

" වරෙන්කො මාත් එක්ක කේක් ශොප් එකට ගිහින් එන්න.... "

" ආ යමන්... "

( ගෙදර දොරවල් එහෙම වහලා මන් විශ්වයා එක්ක ගිහින් කේක් එකත් ඔඩර් කරලා විශ්වයා එක්කම ගිහින් කෙල්ලට බර්දේ ඩ්‍රස් එකක් ගත්තා.... )

( අපි දෙන්නා ගෙදර ඇවිල්ලා ටික වෙලාවක් යනකොට කොල්ලො සෙට් එක ආවා... විශ්වයාට කිචන් එකේ වැඩ බාර දීලා මන් ඔෆිස් එකේ හැමෝටමයි අම්මිටයි

ඩැඩියිටයි මහීගෙ අම්මටයි තාත්තිටයිත් මහීගෙ බර්ත්ඩේ එකට එන්න කිව්වා.... දන්න හැමෝටම ඉන්වයිට් කරලා ඉවර වෙනකොට රෑ 10.00 ත් පහුයි..... )

( කෙල්ලගෙ කාමරේටත් ඔලුව දාලා මන් කිවන් එක පැත්තත් බැලුවා.... ඔක්කොම කරලා ඉවර වෙලා උදේ වෙනකොට මම කෙල්ලගෙ රූම් එකට ගිහින් කෙල්ලට ගෙනාව බර්ත්ඩේ ඩ්‍රස් එකත් කෙල්ලගෙ ලගින් තියලා කොල කෑල්ලක ලිව්වෙ ඕක ඇඳගන්න කියලා..... )

..........................................................................................

" හඃ..... නිදි මතයි අප්පා... ම්.. මොකක්ද ඒ සුවඳ.....අ... අනේ ලස්සන ගවුමක් මේක මටද.... "

`` ඕක ඇඳගෙන පල්ලෙහාට එන්න.... ´´

" නපුරා වෙන්න ඇති.... "

( මම ගවුමත් අරන් වොෂ් රූම් එකට ගිහින් චේන්ජ් කරන් ආවා... එනකොට ලස්සන අක්ක කෙනෙක් මගේ රූම් එකේ ඇඳ උඩ වාඩි වෙලා හිටියා... )

" නංගි ඔයා ලෑස්තිද... එන්නකො අපි කොණ්ඩෙ ටිකක් හදමු..."

" කව්ද ඔයා.... ඇයි මගේ කොණ්ඩෙ හදන්නෙ... "

" මම නිසුලි... අහී තමයි මට කිව්වෙ ඔයාව ලෑස්ති කරන්න කියලා... "

" ආ.. නපුරද... හරි... "

...............................................................................

( කෙල්ල හිනාවෙවී පල්ලෙහාට එනකොට මන් කෙල්ල දිහා කට ඇරන් බලන් හිටියෙ කෙල්ල ඒ තරමට ම ලස්සන නිසා.... )

( කෙල්ලත් එක්ක මන් ස්ටුඩියෝ එකක්ට ගියේ පොටෝ ගහන්න..... )

( ගෙදර එනකොට මහීගෙ අම්මිලා තාත්තිලා... අපේ අම්මියි තාත්තියි දෙන්නත් ඇවිල්ලා හිටියා...)

( උදේම විශ්වයා යවලා කේක් එක අරන් ආවා... ඊට පස්සෙ ඉතින් කේක් කැපුවා... )

( දවල් වෙද්දි ෆැමිලි එකේ නෑයො ටික ඇවිල්ලා හිටියා... මහීට කිව්වෙ හැමෝත් එක්ක ම හිනා වෙලා කතා කරන්න කියලා.... මොකද මහීට කිසි දෙයක් තාම මතක නැති නිසා... ෆැමිලි එකේ අය ඒවා දන්නෙත් නැති නිසා... එයාලා ඒ ගැන නොදැන ඉන්න එක හොදයි කියලා මට හිතුනා.... එයා ෆැමිලි එකේ අය එක්ක ඉදිද්දි ඒ හැම වෙලාවක ම මන් මහී ලගින් හිටියේ මහීට උත්තර දී ගන්න බැරි ඒවට මට උත්තර දෙන්න පුළුවන් නිසා.. )

( හවස් වෙද්දි කෙල්ලට වොෂ් එකක් දාගන්න කියලා මන් විශ්වයා එක්ක ගිහින් ස්ටුඩියෝ එකෙන් පොටෝ ටික අරන් ආවා... )

( ගිහින් එනකොට ගෙදරට ඔෆිස් එකේ හැමෝමත් ඇවිල්ලා.... ඒ විතරක් නෙමෙයි විශ්වයා මටත් නොකියා Dj එකකුත් ගස්සන්න ප්ලෑන් කරලා.... )

( කෙල්ලත් ඉතින් රෑ වෙනකන් හොඳට නැටුවා.... පස්සෙ ඉතින් අම්මිලා ඩැඩීලා ගියා.... හැමෝම ගෙදරින් යනකොට උදේ 3.00 ත් පහුයි.... උදේ වෙනකොට ආය විශ්වලා ඇවිල්ලා ඔක්කොම අස් කරන්න උදව් කරලා ගියා... )

( සුපුරුදු පරිදි එදා දවසත් ගෙවිලා ගියා.... කෙල්ල රෑ වෙලා නගෙන මගේ රූම් එකට ආවේ කොටමම කොට මගේ ෂට් එකක් ඇඳන්.... )

" මහී... ඇයි ඔය.... "

" ඇයි... "

" ඇයි කියන්නෙ ඔච්චර කොටට අඳින සිරිතක් තියෙනවද ආ.... "

" ඉතින් ගෙදරටනේ... නපුරා.... "

( වෙනදා වගේ අද ඉන්න බැරි වුණා මට... මාත් ඉතින් කොල්ලෙක්නේ.... හැඟීම් දැනීම් කියන දෙයක් කොල්ලොන්ටත් තියෙනවා.... )

( එසැණින් ම කෙල්ලව ඇඳට තල්ලු කරලා දාලා මගේ ඇවිස්සුනු හැඟීම් වලට ඇති තරම් ඉඩ දුන්නා.... ඔව් මම උමතු වෙලා... කෙල්ලගෙ කෙඳිරිල්ල යාන්තමට වගේ ඇහෙද්දි මන් කෙල්ලගෙන් ඈත් වුණා.... )

( රෑ කියලා නොබලා මාත් නා ගෙන කෙල්ලටත් බෙඩ්ශීට් එක පොරවලා නිදා ගත්තා... )

`` තමුසෙ මොකද මගෙ ඇඳේ කරන්නේ... මගේ මහීට විතරයි මාත් එක්ක එකට නිදා ගන්න පුළුවන්...... ´´

( දේශිකා මාත් එක්ක ඇදේ නිදාගෙන ඉන්නවා වගේ දැක්ක නිසා හිත හිත ඉන්නෙ නැතුව හොඳ පයින් පාරක් ගැහුවා ඇදේ ඉන්න එකාට බිම වැටෙන්නම.... )

" අහ්.... "

" හුටා දෙයියනේ දේශිකා නෙමෙයිනේ කෙල්ලනේ... අයියෝ.... "

( මහී බෙඩ්ශීට් එකත් එක අතකින් අල්ලගෙන ඔලුවටත් එක අතක් තියාගෙන මගේ දිහා බලන් හිටියේ කන්න වගේ... )

................................................................................................................................

**10 කොටස (අවසානය)**

" ඇයි මනුස්සයෝ මට පයින් ගැහුවේ... රිදෙනවා මගෙ ඔලුව.... ආව්.... "

" අයියෝ සොරි බබී.... "

" බබී... කව්ද බබී.... අනික ඇයි අපි මෙහෙ ඉන්නෙ.... බලන්න මගෙ ඇඳුම කෝ... අනේ අහී... ලැජ්ජ නැද්ද අප්පා.... "

( මන් එහෙම කියද්දිත් අහී මන් දිහා බලන් ඉන්නවා..... )

" අහී.... "

" අ... අ... මි... මේ ඕ.. ඔයාට මතකයිද.... මේ ජ්... පොඩ්ඩක් ඉන්න... "

( මේ මනුස්සයා එහෙම කියලා දුවලා ගියා... එපාර පෝන් එකත් අරන් ආය දුවන් ආවා.... )

" ම... මහී... මට කියන්න මේ කව්ද...."

( කෙල්ලට දේශිකාගෙ පොටෝ එකක් පෙන්නුවාම කෙල්ල මන් දිහා බැලුවේ ඔරවලා... )

" මේද... මේ තමයි දේශිකා හිතන්න එපා මන් දන්නෑ කියලා.... මන් වොෂ් එකා දාන්න යනවා... මට ඇඳුමක් දෙන්න.... හ්... "

( කෙල්ල එහෙම කියලා ගියාම මන් පෝන් එකත් ඇදට විසි කරලා උඩ පැන පැන හිනා වුණේ මට දැනුන සතුටටමයි.... )

( කෙල්ලටත් කෙල්ලගෙ ඇදුමක් දීලා මන් කෝල් කරේ විශ්වයට... )

" හෙලෝ... බන්... මේ කෙල්ලට හැමදේම මතක් වෙලද කොහේ..... ඒකිට මන් දේශිකාව පෙන්නලා ඇහුවා... බන් ඒකි මට බැන්න පළු යන්න... "

" වට්... ඉදහන් ඉදහන් මන් එන්නම් අද හවසට... ඊට පස්සෙ කතා කරමු.... "

( කෙල්ලව ඩොක්ටර් ලගට එක්කන් ගිහිල්ලා කෙල්ල ආසම තැනට කෙල්ලව එක්කන් ගියා... )

" අභී.... ඇයි එදා ඔයා මට ඒ විදියට බැන්නෙ... මන් මොන වරදක් කරාටද... ප්‍රොමිස් වෙන්න ආය මට බනින්නෙ නෑ කියලා... "

" අයියෝ හරි හරි මැණික... දන්නවද මන් ඔයාට ගොඩක් ආදරෙයි.... "

" මාත් එහෙමයි අභී... අයි ලව් යූ වූ... "

නිමි ...........